ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2014/07/31 |

## 2014 ජූලි මාසයේ උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, වාර්ෂික සාමාන්‍ය පදනම මත, අඛණ්ඩව 14 වැනි මාසයටත් පහළ වැටෙමින්, 2014 ජුනි මාසයේ පැවති සියයට 4.9 හි සිට 2014 ජූලි මාසයේ දී සියයට 4.7 දක්වා තවදුරටත් පහළ ගියේය. පසුගිය මාසයේ දී සියයට 2.8 ක්ව පැවැති ලක්ෂ්‍යමය උද්ධමනය, ආහාර අයිතමයන්හි මිල ගණන් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස, 2014 ජූලි මාසයේ දී සියයට 3.6 දක්වා ඉහළ ගිය ද, වසර තුළ මේ දක්වා පහළ තනි ඉලක්කමක මට්ටමෙහි පැවතිණි.



සමස්තයක් ලෙස, ආහාර නොවන කාණ්ඩයේ අයිතමයන්හි මිල ගණන් ස්ථාවරව පැවැතීම 2014 ජූලි මාසයේ උද්ධමනය පහළ මට්ටමක පවත්වා ගැනීමට දායක විය. මෙම කාණ්ඩය තුළ, නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන යන උප කාණ්ඩයෙහි මිල ගණන් පහළ වැටුණු අතර, විවිධ භාණ්ඩ හා සේවා උප කාණ්ඩයෙහි මිල ගණන් ඉහළ ගියේය. රෙදිපිළි හා පාවහන්; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තුව; සෞඛ්‍ය; ප්‍රවාහන; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; සහ අධ්‍යාපන යන අනෙකුත් සියලුම උප කාණ්ඩයන්හි මිල ගණන් පසුගිය මාසයට සාපේක්ෂව 2014 ජූලි මාසයේ දී නොවෙනස්ව පැවැතිණි.

කො.පා.මි. දර්ශකයෙහි මාසික ඉහළ යාමට (සියයට 1.0) ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ අයිතමයන්හි මිල ගණන් ඉහළ යාම ප්‍රධාන වශයෙන් දායක විය. ආහාර කාණ්ඩය තුළ, එළවළු වර්ග බොහොමයක සාමාන්‍ය මිල ගණන් ඉහළ යාමට මාසය තුළ දී ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවලට බලපෑ නියං තත්ත්වය හේතු විය. සෘතුමය සාධක හේතු කොටගෙන නැවුම් මත්ස්‍ය හා කරවල වර්ග බොහොමයක මෙන්ම බිත්තර, ලොකු ළූණු සහ අමු මිරිස් මිල ගණන් ද ඉහළ ගියේය. කෙසේ වුවද, පළතුරු වර්ග කිහිපයක මිල ගණන් පහළ වැටිණි.

සමස්ත ඉල්ලුමෙහි විචලනයන්ට ප්‍රතිචාර දක්වන මූලික උද්ධමනය, පසුගිය මාසයට සාපේක්ෂව, 2014 ජූලි මාසයේ දී සුළු වශයෙන් ඉහළ නැගිණි. ඒ අනුව, ලක්ෂ්‍යමය හා වාර්ෂික සාමාන්‍ය පදනම මත මූලික උද්ධමනය 2014 ජුනි මාසයේ දී වාර්තා වූ පිළිවෙළින් සියයට 3.5 හා සියයට 3.0 සිට, 2014 ජූලි මාසයේ දී පිළිවෙළින් සියයට 3.7 හා සියයට 3.1 දක්වා ඉහළ නැගිණි.